# ශ්‍රී ලාංකික ගුහා වාස්තුවිද්‍යාවේ අවධි කිහිපයක් නිරූපිත රිදිවිහාරයේ, මහාවිහාර ලෙන පිළිබඳ ව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඒ.එච්.එම්.එස්.පී. අබේසිංහ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sandyaahm70@gmail.com

ප්‍රමුඛ පදඃ රිදී විහාරය, මහාවිහාර ලෙන, වාස්තුවිද්‍යාව

## හැඳින්වීම

දේශීය වාස්තුවිද්‍යා සන්දර්භයෙහි මුල් කාලීන සමාජ ව්‍යූහය තුළ පැවති ප්‍රධාන වාස්තුවිද්‍යාත්මක අංගයක් ලෙස ගල් ලෙන් හඳුනාගත හැකි ය. ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට මානව වාසස්ථාන සඳහා භාවිතවන මෙම ලෙන් පරිහරණය කිරීම කාලයත් සමඟ ක්‍රමක් ක්‍රමයෙන් සංවර්ධනය විය. කෙසේ නමුත් මහින්දාගමනයෙන් පසුව භික්ෂු, භික්ෂුනී පරිහරණය සඳහා ගල් ලෙන් භාවිත කිරීම බහුල ව සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස රට පුරා දහස් ගණනක් ගල් ලෙන් ආශ්‍රිත ව වාසස්ථාන ආරම්භ වී ඇත. ජනාකීර්ණ පරිසරයෙන් පරිබාහිර ව බොහෝ දුරට කන්දක් ආශ්‍රිත ගල් කුලක් මූලික කර ගෙන මෙම ගල් ලෙන් ඉදි වී ඇති බැව් හඳුනාගත හැකි ය. එසේ බිහි වූ ගල් ලෙන් අතර මිහින්තලය, අභයගිරිය, වෙස්සගිරිය, රිටිගල, පිදුරංගල, සිතුල් පව්ව සහ තන්තිරිමලය යන ස්ථාන බොහෝ දුරට එකිනෙක ආසන්නයෙන් පිහිටා ඇති නමුත් එම පොකුරෙන් මිදී දසත විහිදි තවත් ස්ථාන පැවති බව ද හඳුනාගත හැකි ය. එ වැනි ස්ථානයක් ලෙස කුරුණෑගල රිදී විහාරය හඳුනාගත හැකි ය. මෙම ස්ථානය ආශ්‍රිත ව ගල් ලෙන් විසි පහක් පමණ පිහිටා ඇති බවට කරුණු දක්වන නමුත් මෙයින් සාධක සහිත ව හඳුනාගත හැක්කේ ගල් ලෙන් අටක් පමණ ය (**Paranavitharana**, 1970 : 69). ඒ අතරිනුදු ගල් ලෙන් භාවිත කිරීම සහ විවිධ අවධීන්හි දී සංවර්ධනය වෙමින් පැවත එන මහවිහාර ලෙන පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කර මෙම පර්යේෂණය සිදු කර ඇත. දේශීය වාස්තුවිද්‍යාවේ සුවිශේෂී සංධිස්ථානයක් සලකුණු කළ ගල් ලෙන් ආශ්‍රිත ව හඳුනාගත හැකි ඉදිකිරීම් ක්‍රම සහ ස්වාභාවික පිහිටි ගල් ලෙනක් වර්තමානයේ දැක්වෙන ප්‍රතිමා ගෘහයක් දක්වා සංවර්ධනය වීමේ දී වාස්තුවිද්‍යාත්මක වශයෙන් ක්‍රමයෙන් දියුණුවට පත් වූයේ කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මඟින් ප්‍රධාන වශයෙන් අරමුණු කරන ලදී. එමෙන් ම කලාත්මක අංග ක්‍රමයෙන් සංවර්ධනය වීමට අදාළ ව හමු වන සාධක අධ්‍යයනය කිරීමට අරමුණු කෙරෙයි.

## ක්‍රමවේදය

යථෝක්ත පර්යේෂණ ගැටලුව විසඳා ගැනීමේ ආරම්භක පියවර වශයෙන් ශ්‍රී ලංකාවේ ඉ පැරණි ගල් ලෙන් පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරන ලද අතර ඉන් අනතුරු ව සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු එක් රැස් කිරීමක් සිදු කරන ලදී. රිදී විහාරයේ මහවිහාර ලෙන පිළිබඳ ව මේ වන විට පූර්ව පර්යේෂකයන් විසින් අනාවරණය කර ගෙන ඇති දත්ත විමර්ෂණාත්මක ව විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව අදාළ ක්ෂේත්‍රය අධ්‍යයනය කරන ලදී. එහි දී අවශ්‍ය පරිදි ඡායාරූප ලබා ගනිමින් සහ සැලසුම් අඳිමින් මෙම

පර්යේෂණයට අවශ්‍ය තොරතුරු රැස් කරන කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජධානි යුග ත්‍රිත්වයට ම හිමිකම් කියන වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සහිත ඉ පැරණි රජ මහා විහාරයක් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රිදී විහාරය හඳුනාගත හැකි ය. අනුරාධපුර යුගය, පොළොන්නරු යුගය සහ මහනුවර යුගයට අයත් ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ සහ කලා නිර්මාණ මෙම ස්ථානයෙන් හඳුනාගත හැකි වීම විශේෂත්වයකි. මෙහි ප්‍රධාන වශයෙන් ම විහාර ත්‍රිත්වයකි. මහා විහාරය, ඉහළ විහාරය සහ වරකා වැළඳූ විහාරය වශයෙන් ප්‍රධාන විහාර තුනක් පවතින අතර තවත් බොහෝ වටිනා ස්මාරක ද මෙම විහාරස්ථානයෙන් හඳුනාගත හැකි ය. මේ අතරින් පර්යේෂණය සඳහා තෝරාගන්නා ලද මහා විහාරය ප්‍රධාන විහාරය වශයෙන් සලකනු ලැබෙයි. අධ්‍යයන අවධිය වන විට ප්‍රතිමා ගෘහයක් වශයෙන් සංවර්ධනය වී තිබුණ නමුත් ගල් ලෙන් පරිහරණ කිරීමේ මුල් කාලීන සාධක ද මෙහි පැහැදිළි ව හඳුනාගත හැකි ය.

සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් නිශ්චිත වශයෙන් ලෙන හඳුනා ගැනීම සිදු කරන ලදී. එහිදී වංශකතාගත තොරතුරු සහ සෙල්ලිපි තුළින් පැහැදිළි සාධක හමු විය. පළමුවෙන් ම මෙහි වාස්තු විද්‍යාත්මක අංග කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම ලෙන වර්තමානයේ පිළිම ගෙයක් වශයෙන් භාවිත වුව ද එය තුළින් අතීත ගල් ලෙන් ඉදිරිකිරීම් තාක්‍ෂණයේ විවිධ අවධි නිරූපණය කෙරෙන බව හඳුනාගත හැකි විය.

මෙහි තාක්‍ෂණික පාර්ෂවය නිරූපිත අංශ දෙකක් යටතේ පෙන්වාදිය හැකි ය. එනම්,

- ඉදිකිරීම් තාක්‍ෂණය
- ද්‍රව්‍ය භාවිතය

ස්වභාවික ගල් ලෙන් අවශ්‍යතාවය අනුව පරිහරණය සඳහා යොදා ගත් නමුත් කාලීන ව තාක්‍ෂණයේ දියුණුව සහ මානව නව්‍යජනනීය සිතුවිලි හමුවේ විවිධ සංස්කරණයන්ට භාජනය වීම මෙම ලෙන තුළින් හඳුනාගත හැකි ය. එමෙන් ම එහි විවිධ අවස්ථාවන් වර්තමානය වන විට ද සජීවී ලෙසින් ආරක්‍ෂා වන පරිදි ඉදිකිරීම් සිදු කර තිබීම ද විශේෂත්වයකි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලන යුග වශයෙන් ගත් කල්හි ප්‍රධාන යුග දෙකක පැහැදිළි තාක්‍ෂණික පියසටහන් මෙම විහාරය තුළින් හඳුනාගත හැකි ය. ඒ අතර අනුරාධපුර සහ මහනුවර යන යුග ද්විත්වයට අයත් සාධක දක්නට ලැබෙයි. මේ අතරිනුදු මහනුවර යුගයේ ශිල්පියාගේ ශිල්පීය ප්‍රාගුණ්‍ය සහ තාක්‍ෂණික පාර්ශවයෙහිලා දක්වා ඇති දක්‍ෂතාවය හුවා දක්වන කැඩපතක් බඳු සේ සැලකිය හැක්කේ මෙහි දක්නට ලැබෙන ඉදිකිරීම් බොහෝමයක් මහනුවර යුගයට යාවන හෙයිනි. මෙහි පාදම සකස් කිරීම, බිත්ති බැඳීම, වහලය සැකසීම, වැද්දුම් ශිල්ප ක්‍රම, කලා නිර්මාණ අතර දක්නට ලැබෙන විවිධ තාක්‍ෂණික අවස්ථා පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරන ලදී. එමෙන් ම මෙම ලෙන මහනුවර යුගයේ කලා නිර්මාණ සංචිතයක් ලෙසින් ද හඳුනාගත හැකි ය. මෙම විහාරයේ ආරම්භය අනුරාධපුර යුගය දක්වා යා වන නමුත් එහි දක්නට ලැබෙන කලා නිර්මාණ බොහෝමයක් අයත් වන්නේ මහනුවර යුගයට ය. මෙම ස්ථානය කැටයම්, ප්‍රතිමා සහ සිතුවම්වලින් අලංකෘත කර ඇත. මෙහි සිතුවම් ගල් ලෙනෙහි කටාරයට පහළින්, ලෙන් බිත්තිය මත සහ ඇතුළත සෙවෙනි මත වශයෙන් ස්ථාන ත්‍රිත්වයක දක්නට ලැබෙයි. මෙහි සිතුවම් ඇඳීමේ සුවිශේෂී අවස්ථාවන් නිරූපණය කෙරෙන ලඹ තට්ටුව භාවිත කළ අවස්ථාවක්

හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම ලෙන් විහාරය වාස්තුවිද්‍යාත්මක සහ කලාත්මක අගයෙන් අනූන, පුරාවිද්‍යාත්මක සාධක වර්තමානය වන විටත් ශේෂ වී ඇති වැදගත් ස්ථානයක් ලෙස අවිවාදයෙන් යුතුව පිළිගත හැකි ය. රිදී විහාරයෙහි මහවිහාර ලෙන ද වර්තමානය වන විට ප්‍රතිමා ගෘහයක් වශයෙන් වන්දනාවට පාත්‍ර වුව ද සරල ආකාරයේ සිට සංවර්ධනය වූ ගල් ලෙනක් ලෙස හමු වන සාධක අනුව නිගමනය කළ හැකි ය. කාලානුරූපීව වෙනස් වූ මෙම ලෙන වර්තමාන අවධිය වන විට ද ගල් ලෙන් ආශ්‍රිත ඉදිකිරීම් පියවරයන් පිළිබඳ ව නිවැරදි සාධක ලබා දෙන්නා වූ ස්ථානයක් ලෙස ගිණිය හැකි ය. එමෙන් ම වාස්තුවිද්‍යාත්මක වශයෙන් සිදු කරන ලද අධ්‍යයනයක් තුළින් ඉදිකිරීම් තාක්ෂණය සහ එහි වර්ධනය, කලාවේ ස්වරූපය සහ විවිධ අවධි, භාහිර ශෛලීන්ගේ බලපෑම, භෞතික පරිසරය සහ භූමි පරිභෝජනය යනාදිය පිළිබඳ ව සම්පූර්ණය අවබෝධයක් එමගින් ලබා ගත හැකි වෙයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කුමාරස්වාමී, ඒ. (1994) ***මධ්‍යකාලීන සිංහල කලා;*** ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව: කොළඹ.

හේරත්, එම්.බී. (2004) ***ගඩොලාදෙණිය රජමහා විහාරය;*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව: කොළඹ.

සෙනවිරුවන්, එම්. (1998) ***සිංහල වාස්තු කිරිත්තම;*** කතෘ ප්‍රකාශන.

සෙනවිරුවන්, එම්. (1998) ***හෙළ බදාම වරුණ;*** ඉවන්සි කොමියුනිකේෂන්: හොරණ.